84103

AL/2016/71/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | | |
|---|---|---|---|
| සිංහල I<br>சிங்களம் I<br>Sinhala I | 71 S I | | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස්:**

✳ **පළමුවැනි** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

✳ පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.

● පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**1.** (අ) පටාචාරාවෝ ද සෝවාන්වලා ගිහිගෙයි රඳා හිඳ දුටු සැපයක් ම නැති හෙයින් මහණ කරන්ට ආරාධනා කළහ. බුදුහු උන් මහණ කරන්ට මෙහෙණින්නන් ළඟට යවූ සේක. මෙහෙණින්නෝත් මහණ මාලුපැවිදි කළහ. ආචාර්ය උපාධ්‍යාය තැන් ඇති ව මහලුපැවිද්ද ලත් හෙයින් නැති වූ දෙමවුපියන්ට ශාසනයෙන් දෙමවුපියනුත් ලැබ පටාචාරා ස්ථවිරි යයි ප්‍රසිද්ධ වූහ. එක් දවසක් කළයෙකින් පැන් හැර ගෙන පය සෝධන්නාහු පයට පැන් වත් කළහ. ඒ පැන් බිම මඳ තැනක් ගොසින්ලා බී ගියේ ය. දෙවන දවස් පය සේධූ පැන් ආදී දවස් පැන් ගිය තැන පැන් බී යන්ට මඳ හෙයින් එ පන්වා මඳක් දුරු ව ගොසින්ලා බී ගියේ ය.

(i) පටාචාරා මහණ වන්නට සිතුයේ ඇයි?

(ii) පටාචාරා මෙහෙණියට නැවත දෙමව්පියන් ලැබුණේ කෙසේ ද?

(iii) පටාචාරාවන් දවස් දෙකක දී පයට වත් කළ පැන් බිම බී ගිය ආකාරය පැහැදිලි කරන්න.

(iv) **"මාලුපැවිදි"**, **"බී ගියේ ය"** යන වචනවල තේරුම ලියන්න. (ලකුණු 04 යි.)

(ආ) බරණැස් නුවර බඹදත් නම් රජ තමාගේ පුත් සොත්ථිසේන නම් රජ කුමරුවා වැඩි වයසට පැමිණියාහු යුවරජ තනතුරෙහි පිහිටුවා සම්බුලා රාජකුමාරිකාව ඕ හට අගමෙහෙසුන් කොට පාවා දුන්නේ ය. ඕ තොමෝ උතුම් රූ දරන්නී ය. විශිෂ්ට වූ ශරීර වර්ණ ඇති විය. අන්ධකාරයෙහිත් පහන් නැති තැන ලන පහනක් මෙන් බබළන්නී ය. මෙසේ ඔවුන් දෙදෙන ප්‍රියසංවාසයෙන් කලක් විසූ කල්හි කල් යාමකින් සොත්ථිසේන නම් යුවරජහට අසාධ්‍ය වූ කුෂ්ඨ රෝගයක් ඇති වූයේ ය. එකල්හි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ දඹදිව ප්‍රසිද්ධ බොහෝ වෙදවරුන් ගෙන්වා පිළියම් කරවාත් සමනය කොටගත නො හී අසාධ්‍යයහ යි අළහ.

(i) බඹදත් රජ තම පුත් කුමරු කිනම් තනතුරක පිහිටවූයේ ද?

(ii) මෙහි වර්ණිත ස්ත්‍රියගේ ශරීර ස්වභාවය උපමා කොට ඇත්තේ කුමකට ද?

(iii) බ්‍රහ්මදත්ත රජතුමා යුවරජුගේ රෝගය අසාධ්‍ය යැයි තීරණය කළේ කෙසේ ද?

(iv) **'ප්‍රියසංවාසයෙන්'** හා **'අසාධ්‍ය'** යන වචනවලට අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

(ඉ) දේවයන් වහන්ස, මේ බෙහෙත් කැඳ නම් සියලු ව්‍යාධි නසන උතුම් වූ දිව්‍ය ඖෂධයෙක, මේ බෙහෙත් කැඳින් මඳක් ඇස ඇඳි ඇසිල්ලෙහි අන්ධයෝ ඇස් ලැබෙති. ගඬපොළ කස් ආදී වූ සියලු රෝග සන්හිඳෙයි, මේ කැඳින් මඳක් අනුභව කළ ඇසිල්ලෙහි ගොළුවෝ කතා කෙරෙති, බිහිරි නැති වෙයි, සියලඟ රැලි නැති වෙයි, ඉස නර නැති වෙයි. මේ පෘථිවිතෙලෙහි සත්ත්වයන්ට ඇති වන යම් ම ව්‍යාධියකට මේ ඖෂධය ම පමණ ය. මේ ලෝකයෙහි බොහෝ ධනධාන්‍ය සම්පත් ඇති ව සර්වාභරණයෙන් සැරහී ඇවිදුනේ වී නමුදු ඉදින් රෝගී වී නම් ඉතා නොහොබනේ ම ය. මේ ලෝකයෙහි නිර්ව්‍යාධි බව හා සමාන අන්කිසි ධන ධාන්‍යයෙක් නැතැයි කිසි ව්‍යාධියක් නැති නීරෝගී තැනැත්තේ හැම තැන්හි ම ශොභාමත් ව බබළයි කීහ.

(i) මේ ඖෂධයෙන් සමට හා කෙස්වලට ඇති වන බලපෑම කුමක් ද?

(ii) මෙකී ඖෂධය භාවිත කළ යුත්තේ කෙබඳු ආකාරවලින් ද?

(iii) මේ ලෝකයෙහි ධනධාන්‍යවලට වඩා අගනේ කුමක් ද?

(iv) **'ව්‍යාධි'** හා **'ගඬපොළ කස්'** යන වචනවල අරුත් පහදන්න. (ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

(ඊ) විදා සිනිඳු සුදු රස් දිගු පිය පතර
නදා සුපුන් හිමකර පියකර තිසර
සදා සිතබ සියපත් නුබ තඹර කර
උදා දෙසෙන් වැද එන රඟ බල මිතුර

වියත උදුළ කිරණවු රළ පැහැ පැහැස
දිගත විසුළ සුර ගඟුලැලි දිසි විලස
දියත පතළ පිරිසිදු සඳ රැස් වෙසෙස
තනෙත පුරා දකු දැහැ ගතෙහි සරතස

(i) සඳ පායා චන්ද්‍රකාන්තිය පැතිරී යාම කවියා දුටුවේ කුමන ආකාරයකින් ද?
(ii) 'හිමකර පියකර තිසර' යන්නෙහි කාව්‍යාලංකාරය නම් කරන්න.
(iii) දියත විසිරී ගිය සුර ගඟුලැලි මෙන් දිස් වූයේ කුමක් ද?
(iv) '**තඹරකර**' හා '**කිරණවු**' යන පදවල අරුත් ලියන්න. (ලකුණු 04 යි.)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.
(i) "ආයේත් පිහිට වන්ට බල ඇති තැනක් කරා ම ය."
(ii) "විචාරවත් කමෙක් ඇත්නම් අන්‍යාය මෙලෙස නො පවතී."
(iii) "එම්බල සොඳුර, දොර ඇරපියව."
(iv) "ඔය හැටි අකමැති නම්, බැරිය කියන්න තිබුණා නෙ."
(v) "කලබල නැතුව ඉන්ඩකො, ඒක මම බලාගන්නම්."
(vi) "කකුල හොලවන්නේ නැතුව එක විදියකට ඉඳපන්." (ලකුණු 08 යි.)

(ඌ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

අතින් දෙන කරල් තුඩ ගා බුදින්න නේ
බිතක්කන ඉඳන් නෙත්වට යොමන්න නේ
උදේ හවස්කර ගෙයි වට ලගින්න නේ
තොපට ලොව පටුයි පොඩි ගේ කුරුල්ල නේ

රුවට රුව සමයි තෙපි වී කුරුල්ල නේ
අවට නුබ ගැබේ සිට සිරි බලන්න නේ
බිමට ඉද්ද සේ බැස හැල් නෙළන්න නේ
ගැහැට කැට පහර විඳ දිවි ගෙවන්න නේ

එකට පොදිය එක මල් රැනක සිරි ය
හවස රිවි කිරණ විසිරෙන්නා සරි ය
කීං හඬ නගා ඉගිලෙති පා එඩි ය
හීන් රතු තුඩේ රඳවා අඩු වැඩි ය

වාන් කෙතේ අස්වනු අඩුවා සැබ ව
හීන් තුඩු ගසා සොරු ගත්තා සැබ ව
ඒත් තරහ නැත වී කුරුලනි අස ව
රූන් සරින් මගෙ හිත යයි තෙපි කැටු ව

(ලකුණු 16 යි.)

2. "මිනිස් සිතුවිලිවල යථාස්වරූපය විවිධ අරමුණු ඔස්සේ නිරූපණය වන ආකාරය පැහැදිලි කිරීම සද්ධර්මරත්නාවලි කතුවරයාගේ අභිප්‍රාය විය." නියමිත කතා ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

**නැතහොත්**

විවිධ අවස්ථා නිරූපණයෙහි දී භාෂා භාවිතයෙහි ලා ජාතක කතාකරුවා දැරූ උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී දැයි නියමිත කතා **දෙකක්** අනුසාරයෙන් පහදන්න. (ලකුණු 15 යි.)



EXAMMOOD.LK

**3.** "බණකතා රසාස්වාදය අනුසාරයෙන් පොදු ජනයාට ධර්මාවබෝධයක් ලබා දීම සද්ධර්මාලංකාර කතුවරයාගේ අපේක්ෂාව විය." නියමිත කතාවස්තු ඇසුරු කොට මේ කියමන විමසන්න. (ලකුණු 15 යි.)

**4.** ගිරා සන්දේශ කතුවරයා, සාම්ප්‍රදායික පිරිවෙන් අධ්‍යාපනයේ ස්වරූපය ඉදිරිපත් කරන අයුරු තොටගමුවේ විජයබා පිරිවෙන් වැනුමේ පද්‍ය **තුනක්වත්** ආශ්‍රය කොට ගෙන සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

**5.** "මානව ජීවන චර්යා කෙරෙහි පුද්ගලයන් හෙළන උපේක්ෂා සහගත දෘෂ්ටිය 'මළගිය ඇත්තෝ' නවකතාවෙන් නිරූපණය වේ." විමසන්න. (ලකුණු 15 යි.)

**6.** දරිද්‍රතාව හේතුවෙන් පීඩාවට පත් වන ජන ජීවිතයෙහි යථාර්ථය කලාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා නූතන සිංහල කෙටිකතාකරුවන් සමත් වී ඇති ආකාරය නියමිත කෙටිකතා **තුනක්වත්** ඇසුරෙන් විභාග කරන්න. (ලකුණු 15 යි.)

**7.** ස්වකීය කාව්‍ය අනුභූති වඩා ප්‍රබල ලෙස ඉදිරිපත් කිරීම සඳහා නූතන කවීන් ඉවහල් කොට ගෙන ඇති භාෂාමය උපක්‍රම මොනවා දැයි නූතන පද්‍ය සංග්‍රහයේ ඇතුළත් පද්‍ය පන්ති **තුනක්වත්** නිදසුන් කොට දක්වමින් පහදන්න. (ලකුණු 15 යි.)

**8.** "ජීවිතය සම්බන්ධයෙන් මතු වන අවිනිශ්චිත හා අනපේක්ෂිත අවස්ථාවලට මුහුණ දීම හේතුවෙන් 'රත්නාවලී' නාට්‍යයේ සාගරිකාගේ චරිතය ප්‍රේක්ෂක අවධානයට ලක් වේ." සුදුසු උදාහරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

* * *

EXAMMOOD.LK
EXAMMOOD.LK

AL/2016/71/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

84224

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2016**

සිංහල II
சிங்களம் II
Sinhala II

**71 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය : ..........................

**උපදෙස්:**

* **I** කොටසේ **1** ප්‍රශ්නය ද, **II** කොටසේ **2, 3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* **1** ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. 'ච' අක්ෂරය සැලකෙනුයේ කුමන අක්ෂරයක් ලෙස ද?
(1) කණ්ඨජ (2) කණ්ඨ තාලුජ (3) දන්ත ඖෂ්ඨජ (4) තාලුජ (5) මූර්ධජ (......)

1.2. **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.
(1) කේශාකර්ෂණය, න්‍යෂ්ටික, ශබ්ධාර්ථ, ඡන්දශ්ශාස්ත්‍රය, දළදඬු
(2) ඡන්දශ්ශාස්ත්‍රය, දළදඬු, ශබ්දාර්ථ, කේශාකර්ශණය, න්‍යෂ්ටික
(3) දළදඬු, ශබ්දාර්ථ, ඡන්දස්ශාස්ත්‍රය, න්‍යෂ්ටික, කේෂාකර්ෂණය
(4) න්‍යෂ්ඨික, ඡන්දස්ශාස්ත්‍රය, කේෂාකර්ශනය, ශබ්දාර්ථ, දළදඬු
(5) ශබ්දාර්ථ, කේශාකර්ෂණය, න්‍යෂ්ටික, ඡන්දශ්ශාස්ත්‍රය, දළදඬු (......)

1.3. **අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති** පද පේළිය තෝරන්න.
(1) අනුරාධපුරය, අලව්ව, අතුරුගිරිය, අඹේපුස්ස (2) කතරගම, කළුතර, කඩුවෙල, කදුරුවෙල
(3) මාතර, මාතලේ, මාලිගාතැන්න, මාවතගම (4) වවුනියාව, වඳුරඹ, වලපනේ, වඩමරච්චි
(5) තණමල්විල, තවලම, තලවතුගොඩ, තලාව (......)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශය** තෝරන්න.
(1) ස්වරයකට අනුව පවතින බැවින් අනුස්වාර නම් වේ.
(2) අනුස්වාරය, වචනයක පවතින ස්වරයකට පූර්වයෙන් ද භාවිත වේ.
(3) ව්‍යඤ්ජනයකට පසුව අතරක් නොතබා ම අනුස්වාරය භාවිත වේ.
(4) 'ං' වර්ගාන්තාක්ෂර ගණයට ඇතුළත් කළ හැකි ය.
(5) අනුස්වාරයට පිල්ලම් එක් කළ හැකි ය. (......)

1.5. **ගයනුකිත්ත, රකාරාංශය, රේඵය** හා **යංශය** සහිත වචන **අනුපිළිවෙළින්** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) පෞද්ගලික, දූජින, ක්‍රමික, විද්‍යාව (2) සෞන්දර්ය, ප්‍රබුද්ධ, කණී, ඓක්‍යය
(3) ප්‍රවර්ග, ඌණිරෝම, උපෝෂථ, ධාන්‍ය (4) ඖරසපුත්‍ර, මෞර්ය, අනඝී, වෛද්‍ය
(5) විද්‍යෝදය, ඖදායී, අලෞකික, ප්‍රකට (......)

1.6. එකිනෙකට **අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති** වරණය තෝරන්න.
(1) දන්තජ අකුරු, මාර්ග නීති, සම්බුදු තෙමගුල, මහාවංස ටීකාව
(2) ලෝක චාරිත්‍ර, අල්පේච්ඡ දිවිය, සතර දේවාලය, මුවදෙව්දා විවරණය
(3) ජල පවිත්‍රාගාරය, මානුෂීය ආධාර, ජාතික ව්‍යාපාරය, ආයුර්වේද රෝහල
(4) සඳ මඬල, සුර අඹු, කිරිය අදියර, පෙර අඹර
(5) හෘදරෝග ඒකකය, ඒකාබද්ධ විපක්ෂය, පුනර්ජනනීය බලශක්ති, පරිසර ඇමති (......)

1.7. **තත්සම වචන පමණක්** යෙදී ඇති වරණය කුමක් ද?
(1) ප්‍රධාන, ආකාර, වානර, මෙහෙණ (2) කර්ම, වස්තු, මත්ස්‍ය, විචාර
(3) අග්නි, භූගත, ලොව, විදේශ, (4) පුස්තක, පමණ, දීර්ඝ, ප්‍රහාරය
(5) වාණිජ, ආගමන, ප්‍රසිද්ධ, පතිවත (......)

1.8. මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) මිතුරු - සතුරු, පසමිතුරු, අමිත්‍ර, ශත්‍රැ (2) මුකුලිත - විකසිත, පිපුණු, මිණිමුතු, පුබුදු
(3) අපවිත්‍ර - නිර්මල, පවිත්‍ර, පිවිතුරු, මලින (4) කම්පිත - නිශ්චල, අකම්පිත, අචල, නොසැලෙන
(5) භාග්‍යය - දූර්භාග්‍යය, අවාසනාව, අභාග්‍යය, කාලකණ්ණිකම (......)

1.9. මුලින් දී ඇති පදයට **සමානාර්ථ පදයක්** ඇතුළත් **නො වන** වරණය තෝරන්න.
(1) අඳුර - අන්ධකාර, තිමිර, කළුවර, සන්ධ්‍යාව (2) දෙවියා - සුර, දිව්‍ය, අමර, දෙව්
(3) මුහුණ - වත, වුවන, වක්ත්‍රය, මුව (4) ඇතා - ගජ, හස්ති, වරණ, ද්විප
(5) සිංහ - මිගිඳු, බාසුරු, සිහ, කෙසර (......)

[දෙවැනි පිටුව බලන්න.

1.10. **කරණ, සබඳ, අදර, කම් හා කතු** යන **විභක්ති සමාස** පද **පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(1) ගල්කැටයම්, වනසත්තු, ගොපල්ලා, සත්ත්වලෝකය, පරපුටු
(2) සත්ත්වලෝකය, වනසත්තු, පරපුටු, ගල්කැටයම්, ගොපල්ලා
(3) ගොපල්ලා, සත්ත්වලෝකය, ගල්කැටයම්, පරපුටු, වනසත්තු
(4) ගල්කැටයම්, සත්ත්වලෝකය, වනසත්තු, ගොපල්ලා, පරපුටු
(5) ගල්කැටයම්, වනසත්තු, සත්ත්වලෝකය, ගොපල්ලා, පරපුටු (......)

1.11. **කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත** වරණය තෝරන්න.
(1) බැලිලි, කැවිලි, ඇවිලි, පැටලිලි (2) උතුරන, මතුරන, පතුරන, වගුරන
(3) ශ්‍රවණීය, වරණීය, කරණීය, වන්දනීය (4) කපන, කොටන, පෙරන, මිරිකන
(5) නැටු, බටු, වාටු, දුටු (......)

1.12. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(අ) "**වඩින මැනවි** මහවෙල මැද වෙරළාන" (ආ) "**ඉදිමින්** දිය තුළ නො පෙනී බෝ කල"
(ඉ) "**අවුත්** වල වැදි දනන් එතනට" (ඊ) "වරල් විදහා මසුන් **ඉපිලෙත**"
(1) විධික්‍රියා, පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(2) මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා
(3) විධික්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(4) මිශ්‍රක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(5) පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා (......)

1.13. **අනුක්ත පද දෙකක්** හා **උක්ත පද දෙකක්** අන්තර්ගත වරණය තෝරන්න.
(1) මුවකු, තෝ, මවක, ඉබ්බෙක් (2) කන්‍යාවක්, සූරයකු, දුවක්, හිඟන්නෙක්
(3) අයෙක්, විද්‍යා චක්‍රවර්තීන්, ගිරවුන්, තාපසයන් (4) විදේශිකයෝ, රිතීහු, මා, ගැරඬියෙක්
(5) පියුම්හු, ධීවරයන්, බිහිරෝ, ගොවීහු (......)

1.14. **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පෙළිය තෝරන්න.
(1) නිශ්චල, නිදොස්, අවමඟුල, අනුගමන (2) සම්මන්ත්‍රණ, ප්‍රවේගය, සුලකළ, අභිවාදන
(3) දුගඳ, දුලබ, දුසිරිත්, දුම්බු (4) අබිදම්, උද්ගත, නිර්මල, සුගත
(5) අපවාද, සමාරම්භ, කුදිටු, දුර්වර්ණ (......)

1.15. "**පාඨශාලීය** අධ්‍යාපනයේ ප්‍රගමනය උදෙසා **ගුරුදෙගුරු** දෙපිරිසගේ ම කැපවීම **අත්‍යවශ්‍ය ය.**" යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන් ඇති පද** අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) සමාස, තද්ධිත හා සන්ධි (2) සමාස, සන්ධි හා තද්ධිත
(3) සන්ධි, තද්ධිත හා සමාස (4) තද්ධිත, සන්ධි හා සමාස
(5) තද්ධිත, සමාස හා සන්ධි (......)

1.16. **ව්‍යාකරණානුකූල ව නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?
(1) ප්‍රභාවත්, කුල්මත්, පාපතර, ජ්‍යෙෂ්ඨතම
(2) වහා, සෙද, නොලසා, සහසා
(3) පොරවනය, අඳනය, ලියනය, පෙරනය
(4) මුත්තණුවෝ, ඇමැත්තාණෝ, දියණියෝ, නැනණ්ඩියෝ
(5) අත්පා, කඳබඩ, ඇස්කන්, තොලකට (......)

1.17. **සමාසයක් නො වන පදයක් ඇතුළත්** වරණය තෝරන්න.
(1) පාපියුම්, සැසී, හදවිල, නුවන්මිණ (2) කුරක්කන්පිටි, ඇඹුල්දොඩම්, පිනිජම්බු, බිංකොහොඹ
(3) සුදුල, සුතුර, සුනිල, සුසර (4) තෙමඟුල, පස්ලෝ, දෙලෝ, පසිඳුරන්
(5) තරුඑළිය, නරලොව, ඉබිකටු, රාජසභාව (......)

1.18. **එක ම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.
(1) ප්‍රත්‍යුපකාර, ජාත්‍යන්ධ, අන්වර්ථ, ලෝකාර්ථ (2) කම්මල, සිත්තම්, සන්නස්, ගෙත්තම්
(3) සුළැඟිල්ල, හොරැහින්, මඟුලැතු, වෙදැදුරු (4) ධනේශ්වර, තපෝධන, මහෝදර, යුද්ධෝපකරණ
(5) දීර්ඝායුෂ, පාලනාධිකාරිය, ක්‍රීඩාංගනය, අත්‍යලංකාර (......)

1.19. ව්‍යාකරණානුකූල ව **නිවැරදි වාක්‍යය** තෝරන්න.
(1) ලේඛකයා හෝ ලේඛිකාව හෝ පොතක් රචනා කරන්නේ ය.
(2) දරුවෝ හොඳින් උගනිති'යි දෙමවුපියෝ සිතති.
(3) බොහෝ අපරාධකාරයෝ නූගතුන් ය.
(4) දැයට පණ දිය හැකි නායකයෙක් පහළ වේවා!
(5) දරුව, තිරිසනෙක් මෙන් වැඩ නො කරන්න. (......)

1.20. **වඩාත් ම නිවැරදි පද බෙදීම** සහිත වාක්‍යය තෝරන්න.
(1) කෞතුකාගාරයකින් ස්ව දේශයේ ප්‍රෞඪත්වය පිළිබඳ මනාඅවබෝධයක් ලදහැකි ය.
(2) තාක්ෂණික උපකරණභාවිතය මිනිසා අකාර්යක්ෂ ම කිරීමට හේතුවේ.
(3) සිංහලභාෂාවර්ධනය හා සම්බන්ධ ප්‍රමුඛත ම කාර්යභාරයක් හෙළහවුලෙන් සිදුවිය.
(4) මවුපියදූදරු සම්බන්ධය ගිලිහීයාම සමාජප්‍රගමනයට අහිතකර වූව කී.
(5) සිංහල සාහිත්‍ය ඥානයෙන් පෝෂණය වූ ප්‍රජාවක් අතීතයෙහි අප රටෙහි විසූහ. (......)

(ලකුණු 20 යි.)

EXAMMOOD.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

84224

## II කොටස

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලංකාවේ නිෂ්පාදනය කරන ලද චිත්‍රපටි බොහොමයක් ම රටේ සංස්කෘතික වටිනාකමට අනර්ථකාරී අයුරෙන් බල පා ඇත. ඒවා වෙළෙඳ භාණ්ඩ වශයෙන් සාර්ථක වූ ඉන්දීය චිත්‍රපටිවල හුදු පිටපත් ය. ඒවා භාෂාව කෙලෙසා ප්‍රේක්ෂකයාගේ පහත් ම රුචිකත්වයට තුඩු දෙමින් නිසරු විනෝද ලොවකට පිවිසීමට ඉඩ ලබා දෙයි. දේශීය කලාකරුවනට ඔවුන්ගේ කුසලතා දියුණු කර ගැනීමේ නියම අවස්ථා නො සැලසිණි. එ පමණක් නොව ඔවුන් සතු ඕනෑ ම දක්ෂතාවක් ඉන්දීය ශිල්පීන්ගේ හුදු පිටපත් බවට හැරවීමට සිදු විය.

සමීපස්ථ ඉන්දියාව වැනි විශාල රටක් හා තරගයකට මුහුණ පෑමට සිදු වී තිබෙන හෙයින් ලංකාවේ තුරුණු කලා ද විශිෂ්ට සංස්කෘතිය ද නො නැසී පවත්වා ගැනීමට ලක් රජය විසින් යම් ප්‍රමාණයක ආරක්ෂාවක් සැලසිය යුතු ය. මේ රටේ රුචිකත්වයත් රසිකභාවයත් නොදැනුවත් ව ම, නොකඩව ම විනාශයේ ප්‍රපාතයට යන ගමන වැළැක්විය හැක්කේ එවැනි පියවරකින් පමණි. මෙම දුෂ්කර කටයුත්තේ බරපතළකම සුළු කොට තැකිය නොහේ. අප කැමති වුව ද, නොවුව ද, නිර්දය වේගයෙන් වෙනස් වන නාගරිකත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් කලාව බහුජන සංස්කෘතියත්, සුළු ප්‍රභූ සංස්කෘතියත් වශයෙන් දෙ අන්තයකට යාම නො වැළැක්විය හැකි වනු ඇත. නාගරික සංස්කෘතියේ නිෂ්පාදනයක් වන චිත්‍රපටිය මේ දෙ අන්තයේ ගමනයෙන් වැඩියෙන් ම ආභාසය ලබයි. නවීනතම පර්යේෂණාත්මක සිනමාවත්, නොසැබි සිනමාවත්, මහජන ප්‍රසාදයෙන් ඈත්වීම මීට සාධකයකි.

(i) ලංකාවේ නිෂ්පාදිත චිත්‍රපටි බොහොමයක් රටේ සංස්කෘතික වටිනාකමට අනර්ථකාරී අයුරෙන් බලපෑ බව තහවුරු කෙරෙන නිදසුන් **දෙකක්** දක්වන්න.

(ii) දේශීය කලාකරුවන්ගේ දක්ෂතාවලට මෙහි දී සිදු වූයේ කුමක් ද?

(iii) ලක් රජය කිසියම් ප්‍රමාණයක ආරක්ෂාවක් ලබා දිය යුතු යැයි මේ ලේඛකයා පවසන්නේ කවර කාර්යයක් උදෙසා ද?

(iv) මහජන ප්‍රසාදයෙන් දුරස්ථ වූ චිත්‍රපට වර්ග නම් කරන්න.

(v) චිත්‍රපටිය වැඩියෙන් ආභාසය ලබන අන්ත **දෙක** දක්වන්න.

(ලකුණු 10 යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

අධ්‍යාපනයට ගරු කරන එක ම දේශපාලන සහ සමාජ පිළිවෙත නම් ප්‍රජාතන්ත්‍රවාදයයි පවසා ඇත. පුරවැසියන්ගේ යුක්තිගරුක සහ සුපරිචිත සිත්සතන් ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන බැවින් නූගත් ජනතාවක් අතරේ පහළ වන ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන සිතීමට පවා නො හැකි ය. වැඩෙන පරම්පරාවේ සිතුම් පැතුම් නිවැරදි මං ඔස්සේ යොමු කිරීම සඳහා විශේෂයෙන් සැකසුණු අධ්‍යාපන ක්‍රමයක් සංවර්ධනය කිරීමෙන් ප්‍රජාතන්ත්‍රවාදී රටක් සිය ආරක්ෂාව සලසා ගැනීම වැදගති. ප්‍රජාතන්ත්‍රවාදී රටක අධ්‍යාපන ප්‍රතිපදාවේ ප්‍රධාන කාර්යය වනුයේ ශිෂ්‍යයා සමාජයට පා තබන අවධියේ දී එහි සංකීර්ණභාවය අවබෝධ කර ගැනීමට උපකාර වන පරිදි එය සරල ව ද, නිශ්චිත ව ද ඔහුට ඉදිරිපත් කිරීම ය.

ප්‍රජාතන්ත්‍රවාදී රටවලට සෑම පෙරමුණකින් ම තර්ජන එල්ල වන ලෝකයක ජීවත් වන අප දරුවනට ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන පිළිවෙළ පමණක් අවබෝධ කර දීම ප්‍රමාණවත් නො වේ. ඊට ඇලුම් කිරීමටත් ඒ ගැන උදම් වීමටත් බැලූ බැල්මට දක්නට ලැබෙන එහි ව්‍යාකූලත්වය තුළින් පෙනෙන උත්කෘෂ්ට ආදර්ශ සහ හරය වටහා ගැනීමටත් අපගේ ගැටලු ලුහුඬින් නිරාකරණය කළත් ඉතා හානිකර, ප්‍රජාතන්ත්‍ර විරෝධී කෙටි මාර්ග අනුගමනය කිරීමෙන් වැළකී සිටීමටත් ඔවුනට ඉගැන්විය යුතු ය. මේ අනුව ප්‍රජාතන්ත්‍රවාදී රටක අධ්‍යාපනය ආරම්භයේ පටන් අවසානය දක්වා ම සජීව ක්‍රියාකාරී අත්දැකීම් විය යුතු ය.

(ලකුණු 15 යි.)

[හතරවැනි පිටුව බලන්න.

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) මනුෂ්‍ය සමාජයේ සුළු ආරවුල් විසඳීම සම්බන්ධයෙන් සමථ මණ්ඩලවල පවත්නා වැදගත්කම
(ii) Wi-Fi අන්තර්ජාල පහසුකම් රටපුරා ව්‍යාප්ත කිරීම හා ඉන් ලැබෙන වාසි-අවාසි
(iii) ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වන වකුගඩු රෝගය නිවාරණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග
(iv) මෙරට යටිතල පහසුකම් සංවර්ධනය හා ජාත්‍යන්තර ණය
(v) දියුණුවේ වඩාත් යෝග්‍ය මාවත වනුයේ මිනිසා හදා රට සංවර්ධනය කිරීමයි
(vi) අන්තර්ජාතික ඖෂධ මාෆියාව නිසා පීඩනයට පත් වන අසරණ රෝගීන් (ලකුණු 25 යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල **සදෙස් තැන් ඇතොත් නිදෙස් කොට** ලියන්න.
(i) ඔවුහු කම්කරුවන් වෙති.
(ii) ග්‍රාමසේවා නිලධාරි තනතුර සඳහා කාන්තාවන් බඳවා ගැනෙති.
(iii) යහපත් මිනිසුන් ලොව ප්‍රබෝධ කරති.
(iv) ජනාධිපතිතුමා ව්‍යවස්ථාදායක සභාවට සභිකයන් පත් කරති.
(v) පියකු බඳු ඇදුරිඳු තම දක්ෂ ශිෂ්‍යයන් අන් වියතුන්ට හඳුන්වා දෙයි. (ලකුණු 05 යි.)

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.
(i) දායකයෝ පෙරහැරට ඇතුන් ගෙන්වති.
(ii) මහනාහිමියෝ උපසම්පදා අපේක්ෂකයන් උපසම්පදා කරති.
(iii) ඇමතිතුමා අප පැසසී ය.
(iv) ගුරුවරු දරුවන් යහපතෙහි යෙදවූහ.
(v) නවකතාකරුවෝ විවිධ රචනා ශෛලීන් හඳුන්වා දෙති. (ලකුණු 05 යි.)

(ඉ) **නිවැරදි වාක්‍යයක්** නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.
(i) අම්මා ද අක්කා ද මම ද ගමට (ගියෙමි./ගියෙමු.)
(ii) පෙර (දනවතුන්/දනවත්තු) වූ ඔවුහු අද අසරණ ව සිටිති.
(iii) (වෛද්‍යවරුන්/වෛද්‍යවරු) හෙට රෝහලට පැමිණේවි.
(iv) මව එක් පුතකු වෛද්‍යවරයකු (කෙළේ ය./කළා ය.)
(v) (අප/අපි) උනන්දුවෙන් වැඩ කළ යුතු ය. (ලකුණු 05 යි.)

**5.** (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.
(i) **ස්වභාවෝක්තිය** ද කාව්‍යයට චමත්කාරයක් ගෙන දෙයි.
(ii) ඇතැම් සාහිත්‍ය විචාරකයෝ **චිරන්තන** සාහිත්‍ය ග්‍රන්ථ අගය කරති.
(iii) සියලු ආකාර අපරාධ **මූලෝත්පාටනය** කළ යුතු ව ඇත. (ලකුණු 03 යි.)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.
(i) දියගොඩ දෙකෙහි ම ජීවත් වන
(ii) වනයෙහි හටගන්නා ගින්න
(iii) කිරණ දහසක් ඇත්තේ (ලකුණු 03 යි.)

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.
(i) පුරාණ ස්මාරක .................................. පුරාවිද්‍යාඥයන්ගේ මූලික කාර්යභාරයකි.
(ii) ඇතැම් ගොඩනැඟිලි නිරතුරුව ම .................................. කළ යුතු ව ඇත.
(iii) රජය, මතට ලොල් වූවන් .................................. කරයි.
(iv) අප විදුහලේ ...................... උත්සවය නොබෝදා පැවැත්විණි.
(v) බුදු සසුනේ .................................. සඳහා රාජ්‍ය අනුග්‍රහය අත්‍යවශ්‍ය වේ.
(vi) විදුලි බලාගාර නිරන්තරයෙන් .................................. කිරීම බලධාරීන් සතු කාර්යයකි.
(නඩත්තු/ප්‍රතිසංස්කරණය/චිරස්ථිතිය/සංවත්සර/පුනරුත්ථාපනය/සංරක්ෂණය) (ලකුණු 03 යි.)

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ පදය යොද වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.
(i) **මී** කතුරු විකිණීමට කඩහිමියෝ දැන් දැන් මැළි වෙති.
(ii) සව් **සත** සසර සයුරින් එතෙර වෙත්වා!
(iii) ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය **නා** ගසයි.
(iv) වසු පැටියා කිරි **උර** උරා මවුදෙන වටා ගැවසෙයි.
(v) සමහරු භස්මාවශේෂ දියෙහි **පා** කරති.
(vi) පහන් **තිර** විකිණීමට ඇත. (ලකුණු 06 යි.)



EXAMMOOD.LK EXAMMOOD.LK

**6.** **තද කළු අකුරෙන්** දී ඇති පද **කුමන ව්‍යාකරණ අංගයකට හා අනුඅංගයකට අයත් දැයි** දක්වන්න.

(i) **රියඅනතුර නිසා මහියා** මිය ගියේ ය.

(ii) පුරාතන **ගද්‍යකාව්‍ය** ශබ්ද **මාධුර්යයෙන් අනූන** වර්ණනාවන්ගෙන් යුක්ත ය.

(iii) **පෞරාණික** ලේඛන අතර පනාකඩුව තඹ **සන්නස සුවිශේෂ** වූවකි.

(iv) **කොස්දෙල්** මෙන් **ම ඉන්නල** ද ගෙවතුවල වගා කෙරේ.

(v) ඉහළ **නැගී බිඳෙන** රළ පෙළ බලමින් අපි දිය **කඩනය** අසලට ම ගියෙමු. (ලකුණු 15 යි.)

**7.** (අ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) අනුවණකම් කළොත් එයට කළ හැකි පිළියමක් ද නැත

(ii) නිසි ඵලප්‍රයෝජන ලබාගත නො හැකි වීම

(iii) කෙටි මං තිබිය දී දිගු මගකින් යාම

(iv) බලවතුන් සමග තරග කොට ජයගත නො හැකි වීම

(v) ලොකු දේ ඇති විට සුළු දේවල් අමතක වීම

(vi) තම වස්තුව නැති කරගෙන අනුන්ගේ පිහිට පැතීම (ලකුණු 03 යි.)

(ආ) පහත දී ඇති **රූඪිවල අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

(i) ඇස් රතු වෙනවා

(ii) යටිමඩි ගහනවා

(iii) හත වදිනවා

(iv) මොළ කනවා

(v) කසුකුසුව

(vi) පන්දම් ඇල්ලීම (ලකුණු 03 යි.)

(ඉ) පහත දී ඇති **එක් එක් යුගල පද සෑදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

(i) සුන් - බුන්

(ii) හබල් - බබල්

(iii) දියුණු - තියුණු

(iv) මළ - ඉළවු

(v) රොඩු - බොඩු

(vi) ගසා - බසා (ලකුණු 03 යි.)

(ඊ) පහත දී ඇති **ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

(i) අට්ටං වෙලා

(ii) ඉස වැදිය

(iii) දොරන්

(iv) ඇහැකියි

(v) සකල ගෝටෙ

(vi) පුනම්මා (ලකුණු 03 යි.)

(උ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත්** ලියන්න.

(i) යුෂ්මතා

(ii) දෙහිය

(iii) යාතිකාව

(iv) අතුරන්නාව

(v) පිරුවටේ

(vi) ඉයත්තුව (ලකුණු 03 යි.)

**8.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඇහැලේපොළමහාදිකාරමශ්‍රීවික්‍රමරාජසිංහරජතුමාගේරාජ්‍යසභාවෙහිසිටිසේනාධිනායකයෙකිප්‍රභූවරයෙකිවං
ශවතෙකිඔහුගේප්‍රියාම්බිකාවවූඇහැලේපොළකුමාරිහාමිරූමත්යපැහැපත්යචරිතවත්යමේදම්පතීන්ටදරුවෝතිදෙනෙ
ක්වූහඉන්මද්දුමයාපවුලේදෙවෙනිදරුවාමද්දුමබණ්ඩාරනම්වියඔහුශෞර්යයෙන්මෙන්මධෛර්යයෙන්දසමුපලක්ෂිතය
එසේමසුවචයකීකරුයතවදමනවඩනනියායෙන්හැසිරෙයිපෙම්වඩනනියායෙන්බෙණෙයිඅහෝබේදයකිමොවුහු සිරිවිකුම්
රජසිහනිරිඳුගේඋදහසටලක්වූණුකුඩාදියණියෝමැණියන්ලවාමවංගෙඩියෙහිලාකොටවනලදහපුතුන්දෙදෙනා
ගේහිස්ගසාමරාදමනලෙසනියමකැරිණිවධකයාකඩුවරුගෙනඑත්මජ්‍යෙෂ්ඨපුත්‍රයාණෝබියපත්වදුවන්නටවන්හළෙහිඅත්
ගසාහඬන්නටවන්හමේදුටුමද්දුමබණ්ඩාරයෝවහාඉදිරියටපැනඅභීතසිංහස්වරයක්විහිදුවාබියනොවන්නඅය්යණ්ඩිමැ
රෙනාහැටිමමපෙන්වන්නෙමියනුවෙන්පවසාඑම්බාගහලයතාගේඅසිපතින්මාගේබෙල්ලටගසාහිසකඳින්වෙන්කරවයිකි
යාදංගෙඩියමත්තෙහිහිසතබාලූහදරුවෙනිඔළමොළකම්නොවඑඩිකම්වවුහීනදීනකම්නොවසුරුවිරුකම්වඩවූ

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) **අඝෝෂ මහාප්‍රාණ** සහිත පද **දෙකක්** ඡේදයෙන් උපුටා දක්වන්න.

(iii) **'ධීර + ය = ධෛර්ය'** නම්, 'දීන + ය' යන්න කෙසේ සකස් විය යුතු ද?

(iv) **'දරුවා'** යන්නෙහි පිල්ලම් නම් කරන්න.

(v) ඡේදයේ ඇතුළත් නො වන **කොම්බු දෙක** සහ **රකාරාංශය** පිළිවෙළින් යෙදී ඇති පද **දෙකක්** ලියන්න. (ලකුණු 15 යි.)

* * *